# 9 පුනරුදය

### හැඳින්වීම

පුනරුදය යන වචනයේ තේරුම යළි ඉපදීම යන්න යි. ක්‍රිස්තු වර්ෂ දාහතරවන සියවසේ සිට දාසයවන සියවස දක්වා යුරෝපයේ කලාත්මක හා විද්‍යාත්මක ක්ෂේත්‍රවල සිදු වූ පුළුල් පරිවර්තනය හැඳින්වීම සඳහා ඉතිහාසඥයෝ පුනරුදය යන වචනය යොදති.

පැරණි ග්‍රීක රෝම ශිෂ්ටාචාර පැවති සමය යුරෝපා ඉතිහාසයේ පුරාතන යුගය ලෙස සැලකේ. ක්‍රිස්තු වර්ෂ 5 වන සියවසේ රෝම ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් පසු ගතවූ වසර දහසක පමණ කාලය යුරෝපයේ මධ්‍යතන යුගය ලෙස හැඳින්වෙයි. මධ්‍යතන යුගය අවසාන කාලයේ දී පැරණි ග්‍රීක රෝම ශිෂ්ටාචාරවල පැවති සාහිත්‍ය, කලාව හා දර්ශනය පිළිබඳ නැවත සොයා බැලීමේ ප්‍රබල උනන්දුවක් යුරෝපය තුළ ඇති විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ග්‍රීක රෝම ශිෂ්ටාචාරවල පැවති පැරණි කලා ශෛලීන් නැවත භාවිතයට ගැනීමත්, සාහිත්‍ය හා දර්ශනය ගැඹුරින් හැදෑරීමට යුරෝපීයන් පෙලඹීමත් නිසා යුරෝපා සමාජයේ පුළුල් පරිවර්තනයක් සිදුවි ය. එමගින් ඉහත කී පැරණි ශිෂ්ටාචාර නැවත පණ ලැබුවේය යන අර්ථයෙන් පුනරුදය යන වචනය භාවිත කෙරේ. පුනරුද සමයේ යුරෝපයේ සෑම ක්ෂේත්‍රයකට පාහේ ඇති වූ වෙනස්කම් නිසා මධ්‍යතන යුගය අභාවයට යාමටත් යුරෝපා ඉතිහාසයේ නූතන යුගය ආරම්භ වීමටත් කරුණු සැලසුණි.

## 9.1 පුනරුදය ඇති වීමට බලපෑ හේතු

### ■ කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කි ජාතිකයන්ට යටත් වීම

මධ්‍යතන යුගයේ අවසාන භාගයේ ඉතා දියුණු වෙළෙඳ නගරයක් වූ කොන්ස්තන්තිනෝපලය යුරෝපා උගතුන්ගේ අවධානය දිනාගත් එකක් විය. කොන්ස්තන්තිනෝපල් නගරයේ තිබූ පුස්තකාලවල ග්‍රීක රෝම සාහිත්‍ය පොතපත තැන්පත්ව තිබූ අතර ග්‍රීක හා රෝම උගත්තු බොහෝ පිරිසක් එහි අධ්‍යයන කටයුතුවල නිරතව සිටියහ. එහෙත් ක්‍රි.ව 1453 දී මෙම නගරය ඉස්ලාම් භක්තික තුර්කි ජාතිකයන්ට යටත් වීම නිසා රෝමානු කතෝලික ආගම ඇදහූ උගතුන්ට තවදුරටත් එම නගරයේ ජීවත් වීමට අපහසු විය. මේ නිසා එම උගත්තු ග්‍රීක රෝම පොත්පත් රැගෙන සෙසු යුරෝපා රටවලට පලා ගොස් ග්‍රීක හා ලතින් භාෂා අධ්‍යයනය එම යුරෝපා නගරවල ප්‍රචලිත කළහ. එහි ප්‍රතිඵල වශයෙන් ග්‍රීක රෝම සංස්කෘතිවල යළි පිබිදීමක් ඇති විය.

### ■ වෙළෙඳාම දියුණු වීම හා නව ධනවතුන් පිරිසක් බිහි වීම

ක්‍රිස්තු වර්ෂ දොළොස්වන සියවසේ සිට පෙරදිග හා අපරදිග රටවල් අතර වෙළෙඳ හා වාණිජ කටයුතුවල දියුණුවක් ඇති විය. මේ නිසා වැනීසිය, ජිනෝවා වැනි වෙළෙඳ නගර පිහිටි ඉතාලියෙහි, වෙළෙඳාම නිෂ්පාදනය හා බැංකු කටයුතුවලින් මුදල් උපයාගත් නව ධනවතුන් පිරිසක් බිහි විය. මෙම ධනවතුන් පැරණි වැඩවසම් රදලයන් මත යැපුණු පිරිසක් නොවූ හෙයින් කලාත්මක කටයුතු කෙරෙහි අවධානය යොමු කිරීමට අවශ්‍ය නිදහස් මනසක් මෙන් ම ඒවාට අනුග්‍රහය දැක්විය හැකි ධන බලයක් ද ඔවුන්ට තිබුණි. ඉතාලියෙහි එකල කුඩා රාජධානි රැසක් පැවති හෙයින් ඒවායේ බිහි වූ ධනවත්තු කලාත්මක කටයුතුවලට අනුග්‍රහය දැක්වීමට ඉදිරිපත් වූහ. පුනරුදය ඉතාලියෙන් ආරම්භ වීමට එය ප්‍රබල හේතුවක් විය. ඉතාලියේ ප්ලෝරන්ස් නගරයේ ජීවත් වූ මෙඩිසි (medici) නම් ධනවත් පවුල එහි කලාත්මක කටයුතුවලට අත හිත දුන් ධනවතුන්ට උදහරණයකි.

### ■ බුද්ධි ප්‍රබෝධය

රෝම ශිෂ්ටාචාරයේ පරිහානියෙන් පසු ආගමික ආයතන මුල් කරගෙන පැවති අධ්‍යාපන ක්‍රමය තුළ ප්‍රධාන විෂය වූයේ දේව ධර්මය, දර්ශනය, නීතිය වැනි විෂය කිහිපයක් පමණි. එහෙත් දොළොස්වන සියවසෙන් පසුව බිහි වූ නව අධ්‍යාපන ආයතනවල පැරණි සාහිත්‍ය, නාට්‍ය, ශබ්ද විද්‍යාව, ඉතිහාසය වැනි නව විෂයන් ඉගැන්වීමට කටයුතු කළ හෙයින් පුනරුද සමය වන විට නව උගතුන් පිරිසක් බිහිවිය. යුරෝපා ජාතීන් තුළ බුද්ධි ප්‍රබෝධයට බලපෑ



නොමිලේ බෙදා හැරීම සඳහා ය.



*ඡායාරූපය අංක 9.1 මයිකල් ආන්ජිලෝ විසින් සිස්ටයින් දෙව්මැදුරේ සිතුවම් කර තිබෙන දේව දරුවන් දෙදෙනෙකු දක්වෙන චිත්‍රයක්*

තවත් හේතුවක් වූයේ මුද්‍රණ කර්මාන්තය යි. වර්ෂ 1454 දී ගුටන්බර්ග් මුද්‍රණ යන්ත්‍රය නිපදවීමත් සමඟ ඉතාලියේ ප්‍රදේශ රැසක මුද්‍රණාල ආරම්භ විය. මේ යටතේ පොත් පත් සුලබ වීමත් ග්‍රීක රෝම පොත් පත් මුද්‍රණයෙන් නිකුත් වීමත් නිසා එම සාහිත්‍ය, නාට්‍ය කලාව ආදිය කෙරෙහි ප්‍රබල උනන්දුවක් ඇති වීමට හේතු විය.

## පල්ලියේ ආධිපත්‍ය විවේචනය වීම

මධ්‍යතන යුගය වන විට පාප් වහන්සේ සහ ක්‍රිස්තියානි පල්ලිය සතුව මහත් බලයක් පැවතුණි. මේ නිසා ආගම මිනිස් ජීවිතයේ බොහෝ අංශ කෙරෙහි විශාල බලපෑමක් ඇති කර තිබුණි. කතෝලික සභාවේ ඇතැම් පූජකවරු ආගමික පැත්තට වඩා ලෞකික පැත්තට බර වූ දිවි පැවැත්මකට හුරු වී සිටියහ. පුනරුද සමයේ නැගී ආ චින්තන ප්‍රබෝධයේ ප්‍රතිඵල වශයෙන් කතෝලික සභාවේ ඇතැම් දුර්වලතා විවේචනයට ලක් විය. එංගලන්තයේ ජෝන් වයික්ලිප්, බොහිමියාවේ ජෝන් හස්, ප්‍රංශයේ ඉරාස්මස් හා ජර්මනියේ මාටින් ලූතර් වැනි අය එබඳු විවේචන කළ අය අතර කැපී පෙනේ.

## යුරෝපයේ වෙනස් වීමට පුනරුදය බලපෑ ආකාරය

යුරෝපයේ මෙතෙක් ආ ගමන් මග වෙනස් කිරීමට පුනරුදය මහත් සේ බලපෑවේය. එය ශාස්ත්‍රීය, දේශපාලන, ආර්ථික හා විද්‍යාත්මක ආදි සෑම අංශයක ම වෙනසක් කිරීමට සමත් විය.

## ශාස්ත්‍රීය පුනරුදය

ශාස්ත්‍රීය පුනරුදය වශයෙන් සලකන්නේ පහළොස්වන සියවසේ යුරෝපයේ භාෂාව, සාහිත්‍ය හා කලා ශිල්ප එනම් චිත්‍ර කලාව, ප්‍රතිමා කලාව, ගෘහ නිර්මාණ ශිල්පය ආදි අංශයන්හි ඇති වූ ප්‍රබෝධය යි.



*නොමිලේ බෙදා හැරීම සඳහා ය.*

## භාෂාව හා සාහිත්‍යයේ පුනර්ජීවනය

මධ්‍යතන යුගයේ දී යුරෝපා රටවල භාවිත වූයේ ගෝත්‍රික භාෂා ය. ආගමික කටයුතුවල දී හා නීතිය හැදෑරීමේ දී යම් ප්‍රමාණයකට ලතින් භාෂාව භාවිත විය. ග්‍රීක භාෂාව මළ භාෂාවක තත්ත්වයට ඇද වැටී තිබුණි. එහෙත් පුනරුද සමයේ දී ග්‍රීක හා ලතින් භාෂාවෙන් ලියවුණු පොත් පත් පරිශීලනය වැඩි වීම නිසා එම භාෂාවල නවෝදයක් ඇති විය. මෙය ශාස්ත්‍රීය පුනරුදයෙහි දී සිදු වූ වැදගත් දෙයකි. එමෙන් ම ලතින් හා ග්‍රීක භාෂාව ඉගෙනීම විලාසිතාවක් ලෙස සැලකීමට ද පටන් ගැනුණි. මේ නිසා එතෙක් භාවිත වූ ප්‍රදේශීය භාෂාව අභාවයට ගියේය.



*ඡායාරූපය අංක 9.2 ගැලිලියෝ ගැලිලි දුරේක්ෂයෙන් අභ්‍යවකාශය පරීක්ෂා කරන අන්දම දැක්වෙන සිතුවමක්. විද්‍යාත්මක සොයා ගැනීම් යුරෝපීය පුනරුද යුගයේ කැපී පෙනෙන ප්‍රවණතාවකි.*

ග්‍රීක ලතින් භාෂාවන් ඉගෙන ගැනීමෙන් පසු එම භාෂාවෙන් ලියවුණ පොත්පත් හැදෑරීම නිසා සාහිත්‍යයේ නව ප්‍රබෝධයක් සිදු විය. විශේෂයෙන් ග්‍රීක නාට්‍ය පිළිබඳ බලවත් උනන්දුවක් ඇති විය. සාහිත්‍යමය වශයෙන් සේවයක් කළ ගත් කතුවරු රැසක් මෙකල බිහි වූහ. ඉතාලියේ ඩාන්ටේ, පෙට්‍රාක්, බොකැෂියෝ, එංගලන්තයේ සර් තෝමස් මුවර්, ෆ්‍රැන්සිස් බේකන් හා විලියම් ෂේක්ස්පියර් ප්‍රංශයේ ඉරාස්මස් ද මේ අතර වැදගත් තැනක් ගනී. ඔවුහු කෘති රැසක් රචනා කළහ. නිදසුන් ලෙස අලගියරි ඩාන්ටේ රචනා කළ ඩිවිනා කොමිඩියා කාව්‍ය ග්‍රන්ථය ද පෙට්‍රාක් රචනා කළ ලෝරාට සැහැලි කවි නම් ග්‍රන්ථය ද පෙන්නුම් කළ හැකි ය.

## මානවවාදය

මානවවාදය හෙවත් මිනිසා උතුම් කොට සැලකීම පුනරුදයේ විශේෂ ලක්ෂණයක් විය. මධ්‍යතන යුගයේ දී සියල්ල ආගම මුල් කරගෙන ආගමික රාමුවක් තුළ සිදු විය. එහෙත් මානවවාදය මුල් වීම නිසා සෑම දෙයක් දෙස ම වඩාත් විචාරාත්මකව බැලීමට පටන් ගැනුණි. දේව ධර්මවාදී විෂයන් වෙනුවට මානවවාදී විෂයන් ඉගෙනීම ආරම්භ විය. උදහරණ වශයෙන් සාහිත්‍යය, ඉතිහාසය, කලාව, නීතිය, ආචාර විද්‍යාව පෙන්නුම් කළ හැකි ය. මේ නිසා ග්‍රීක රෝම ආභාසය ලැබ මානවවාදයට නැඹුරු වූ ගත් කතුවරු රැසක් මෙම යුගයේ බිහි වූහ.



*නොමිලේ බෙදා හැරීම සඳහා ය.*

## කලා ශිල්ප

### පුනරුද සමයේ කලා ශිල්ප ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම්

මධ්‍යතන යුගයේ සියලු ශිල්පීන් සංවිධානය වී සිටියේ ශ්‍රේණි වශයෙනි. මේ නිසා මෙකල බිහි වූ නිර්මාණ ශ්‍රේණිවල නමින් හැඳින්විය. එමෙන් ම කලා ශිල්ප ආගමට නැඹුරු වීම ද විශේෂ ලක්ෂණයකි. කලා කෘතිවලට අනුග්‍රහ දැක්වීමේ ශක්තිය පල්ලියට පමණක් තිබීමත්, මධ්‍යකාලීන චින්තනය ආගමික ඉගැන්වීම් පදනම් කොට ගොඩ නැගී තිබීමත් මෙයට හේතුව විය. මේ නිසා කලාකරුවන්ට තම ශක්තියට අනුව ස්වාධීනව නිර්මාණ කිරීමට ඉඩක් නොතිබුණි. එහෙත් පුනරුද සමයේ මේ සියල්ල වෙනස් විය. කලාකරුවන්ට අනුග්‍රහ දැක්වීමට ලෞකික රස වින්දනය අගය කරන ධනවත්තු ඉදිරිපත් වූහ. පුනරුද සමයේ අගය කරන ලද පුද්ගලවාදයේ ප්‍රතිඵලයක් වශයෙන් කලාකරුවෝ ස්වාධීනව  තම දක්ෂතා ඉස්මතු කරමින් නිර්මාණ බිහි කිරීමට පටන් ගත්හ. එතෙක් ශ්‍රේණිවල නමින් හැඳින්වූ කලා කෘති  ඒවා නිර්මාණය කළ කර්තෘන්ගේ නමින් එළි දැක්වීමට කටයුතු කෙරිණි. මේ නිසා ආගමික සිතුවිලිවලට මුල් තැන දීම වෙනුවට පෞද්ගලිකත්වය ඉස්මතු කෙරෙන ලෞකික රස වින්දනයට මුල් තැන දුන් කලා කෘති රාශියක් බිහි විය.

### චිත්‍ර කලාව

කලා ශිල්ප අතරින් පුනරුද සමයේ ඉතා පුළුල් වෙනසකට ලක් වූයේ චිත්‍ර කලාව යි. ඉතාලියේ ප්ලෝරන්ස් නගරය නව චිත්‍ර කලාවක් බිහි කළ මධ්‍යස්ථානයක් විය. ලෞකික රස වින්දනය සඳහා ස්වාභාවිකත්වයට මුල්තැන දී නිර්මාණ බිහි කිරීම නිසා මෙකල චිත්‍ර හා මූර්තිවල නිරුවත් හා අඩ නිරුවත් රූප දක්නට ලැබේ. මෙතෙක් ආගමික වශයෙන් වැදගත් වූ පුද්ගලයන් එනම් ක්‍රිස්තුස් වහන්සේ, කන්‍යා මරියතුමිය වැනි අය චිත්‍ර වලට  වස්තු විෂය විය. එහෙත් පුනරුද සමයේ ධනවතුන්ගේ රූප චිත්‍රයට නැගීම දැකිය හැකි ය. මෙකල සිටි චිත්‍ර ශිල්පීන් අතරින් ලියනාඩෝ ඩාවින්චි, මයිකල් ආන්ජලෝ, රෆායල්, මැසෙක්ෂියෝ, බොට්ටි චෙල්ලි වැදගත් වේ,

ලියනාඩෝ ඩාවින්චි චිත්‍ර ශිල්පියෙකු මෙන්ම තවත් ක්ෂේත්‍ර ගණනාවක ප්‍රවීණයෙක් ද විය. ඔහු කවියෙක් සංගීතඥයෙක් විද්‍යාඥයෙක් හා ප්‍රායෝගික ඉංජිනේරුවෙක් ද විය. මොහුගේ මොනාලිසා  හා ක්‍රිස්තුස් වහන්සේගේ අන්තිම භෝජන සංග්‍රහ වැනි චිත්‍ර විශ්ව කලා කෘති ලෙස අදටත් ජනප්‍රියත්වයක් උසුලයි.

මයිකල් ආන්ජිලෝ ද මෙකල සිටි දක්ෂ චිත්‍ර ශිල්පියෙකු මෙන්ම මූර්ති හා ගෘහ නිර්මාණ ශිල්පියෙකි. ඔහු සිස්ටයින් දේවස්ථානයේ සිවිලිමේ ඇඳ ඇති සිතුවම් චිත්‍ර කලාවේ විශිෂ්ටත්වය විදහා දක්වයි. අවසාන විනිශ්චය නම් චිත්‍රය හා සිස්ටයින් මන්දිරයේ ම  ඇඳ ඇති ආදම්ගේ චිත්‍රය ද ඔහුගේ චිත්‍ර අතර වැදගත් වේ.

### ප්‍රතිමා කලාව

කලා ශිල්ප අතර නෙළීමේ කලාවට ද පුනරුද සමයේ වැදගත් තැනක් හිමි විය. කිරිගරුඬින් ප්‍රතිමා නෙළීම මෙකල කැපී පෙනෙන ලක්ෂණයකි. මයිකල් ආන්ජිලෝ, පුනරුද සමයේ සිටි අග්‍ර ගණ්‍ය ප්‍රතිමා ශිල්පියෙක් විය. මෙඩිසි පවුලේ ලොරෙන්සෝ මෙඩිසි නිරූපණය කරන ප්‍රතිමාව මොහු කිරිගරුඬින් නෙළා තිබේ. පියෙටා ප්‍රතිමාව ද මොසෙස්ගේ  ප්‍රතිමාව ද දාවිත්ගේ ප්‍රතිමාව ද ඔහුගේ සෙසු නිර්මාණ අතර කැපී පෙනේ.

### ගෘහ නිර්මාණ ශිල්පය

පුනරුද සමයේ ගෘහ නිර්මාණ ශිල්පයේ ද වැදගත් වෙනස්කම් ඇති විය. මධ්‍යතන යුගයේ ගෘහ නිර්මාණ ශිල්පයේ විශේෂ ලක්ෂණය වූයේ උල් කේතු ආකාර හැඩයෙන් යුත් ආරුක්කු, උස් වහල හා පිරමීඩ හැඩයේ කුලුනු ය. ඒ වෙනුවට පුනරුද සමයේ රෝම ගෘහ නිර්මාණ ශිල්පය අනුව වටකුරු, ආරුක්කු, උස් කුලුනු හා අර්ධ ගෝලාකාර ශිඛර ගෘහ නිර්මාණ කලාවේ ප්‍රධාන ලක්ෂණ බවට පත් විය. රෝමවරුන් අනුගමනය කරමින් මෙකල සුඛෝපභෝගී මන්දිර තැනීම ද සිදු කෙරිණි.

ගෘහ නිර්මාණ ශිල්පය මැනවින් පිළිඹිඹු කරන ගොඩනැගිලි අතර රෝමයේ ශාන්ත පීතර බැසිලිකා දේවස්ථානය හා ප්ලෝරන්ස් හි ආසන දෙව්මැදුර කැපී පෙනේ. මයිකල් ආන්ජලෝ, ලියනාඩෝ ඩාවින්චි, රෆායල් පුනරුද සමයේ සිටි දක්ෂ ගෘහ නිර්මාණ ශිල්පීන්ට උදාහරණ වේ.

### විද්‍යාත්මක දියුණුව

පුනරුද සමයේ වැදගත් ලක්ෂණයක් වූයේ විද්‍යාව දියුණු වීම යි. ග්‍රීක රෝම පොත්පත්වල ආභාසය ලද  උගත්තු එක් විෂයකට පමණක් සීමා නොවී විවිධ ක්ෂේත්‍රයන් පිළිබඳ ව විද්‍යාත්මකව සොයා



ඡායාරූපය අංක 9.3 යුරෝපීය පුනරුදයෙන් ඇති වූ වෙනස්කම් ක්ෂේත්‍ර ගණනාවක් වෙත බල පැවැත්විය. වාස්තු විද්‍යාව සහ මූර්ති කලාව ඉන් එක් ක්ෂේත්‍රයකි. මෙම ඡායාරූපයෙන් දක්වෙන්නේ පුනරුද සමයේ ශෛලියට අනුව ප්‍රංශයේ ඉදි කරන ලද නේවාසික ගොඩනැගිල්ලකි.

බැලීමට පෙලඹුණහ. පෘථිවිය, ඉර, හඳ, තරකා ආදි සෑම දෙයක් පිළිබඳව ම ඔවුහු නිරීක්ෂණය කළහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් විශ්වය පිළිබඳ ව නව මත ඉදිරිපත් විය. එසේම විද්‍යාවේ දියුණුවක් ද ඇති විය.

## විශ්වය පිළිබඳව ඉදිරිපත් වූ නව මත

### පෝලන්ත ජාතික නිකලස් කොපර්නිකස්

පෘථිවිය ගෝලාකාර බවත් අනෙකුත් ග්‍රහයන් සූර්යයා වටේ පරිභ්‍රමණය වන බවත් සොයා ගත්තේය. විද්‍යාවට වූ ඉමහත් සේවය නිසා ඔහු නූතන තාරකා විද්‍යාවේ පියා ලෙස හැඳින්වේ.

### එංගලන්ත ජාතික අයිසෙක් නිව්ටන්

ගුරුත්වාකර්ෂණ නියමය සොයා ගත්තේය.

### ජර්මන් ජාතික ජොහැන්ස් කෙප්ලර්

කොපර්නිකස් ඉදිරිපත් කළ අදහස් තහවුරු කොට ඒවා තවදුරටත් ඉදිරියට ගෙන යමින් සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක සූර්යයා වටේ ඉලිප්සාකාරව ගමන් ගන්නා බව සොයා ගත්තේය.

### ඉතාලි ජාතික ගැලීලියෝ ගැලිලි

දුර දක්නය නිපදවීය. එයින් ආකාශ වස්තු නිරීක්ෂණය කර චන්ද්‍ර ආවාට, බ්‍රහස්පති ග්‍රහයාගේ උපග්‍රහයන් ඇති බව සොයා ගත්තේය. ඔහු අත්හද බැලීමේ පියා ලෙස හඳුන්වයි.

- **වෛද්‍ය විද්‍යාවේ දියුණුව**

වෛද්‍ය විද්‍යාවේ නවෝදයක් මෙම අවධියේ ඇති විය.

**ඉංග්‍රීසි ජාතික විලියම් හාවේ**

මිනිස් සිරුරේ රුධිර සංසරණ පද්ධතිය පිළිබඳ වැදගත් තොරතුරු සොයා ගත්තේය.

**ස්විස් ජාතික වෛද්‍ය පැරසල්සස්**

ලෙඩ රෝග සෑදීමට තුඩු දෙන හේතු ද ඒවාට ප්‍රතිකර්ම අත්හදා බැලීය. ඔහු නූතන ඖෂධ විද්‍යාව කෙරෙහි ද රෝග චිකිත්සක ක්‍රම කෙරෙහි ද විශාල බලපෑමක් කළේය.

**ස්විස් ජාතික මයිකල් සර්ටෙස්**

රුධිරය හදවතේ දකුණු කෝෂයන් පිටවී ගොස් පෙනහලු මගින් පිරිසිදු වී යළිත් හදවතට පැමිණ ශරීරය පුරාම විසිරී යෑම පිළිබඳව තොරතුරු සොයා ගත්තේය.

- **ජොහැන්ස් ගුටන්බර්ග්**

ජර්මන් ජාතික ජොහැන්ස් ගුටන්බර්ග් මුද්‍රණ යන්ත්‍රය නිපදවීය.

## දේශපාලන නවෝදය

වැඩවසම් යුගයේ එක් එක් ප්‍රදේශ පාලනය කිරීමේ බලය ප්‍රාදේශීය පාලකයන්ට පවරා තිබුණි. ප්‍රාදේශීය පාලකයන් ලෙස කටයුතු කළේ ඉඩම් හිමි වංශාධිපතිවරුන්ය. ඔවුහු ස්වාධීනව කටයුතු කිරීම නිසා පාලන කටයුතුවල දී ඔවුහු රජුට වඩා බලයක් භුක්ති වින්දහ. එකල ජනතාව එක් එක් ප්‍රදේශීය පාලකයන් යටතේ පාලනය වීම නිසා තමන් ජීවත් වූ ප්‍රදේශයේ වැසියන් ලෙස සිතුවා විනා එක් රටක ජාතියක් ලෙස හැඟීමකින් කටයුතු කළේ ද නැත.

පුනරුද සමයේ ජාතික රාජ්‍ය බිහි වීම දේශපාලන ක්ෂේත්‍රයේ සිදු වූ වැදගත් ම වෙනසකි. වෙන් වෙන්ව තිබූ ප්‍රාදේශීය රාජ්‍ය එක් කොට එක් රජ කෙනෙක් යටතේ එක්සත් කිරීම මෙහි දී සිදු විය. මේ නිසා රජු පාලන කටයුතුවල දී වැදගත් වූ අතර සියලු බලතල රජු වටා කේන්ද්‍රගත විය.

12 වන සියවසේ වෙළෙඳ කටයුතුවල දියුණුවත් සමඟ මධ්‍යම පන්තියක බිහි වීම සිදු විය. මධ්‍යම පන්තිය යනු මේ වන විට වෙළෙඳාමෙන් මුදල් උපයාගෙන ධනවත් වූ පිරිසයි. මෙම පන්තියට වෙළෙන්දන්, බැංකු කරුවන්, නැව් හිමියන් හා තවලම් හිමියන් වැනි පිරිස් අයත් වූහ. මධ්‍යම පන්තිය සමාජයේ බලවත් වීමත් සමඟ ම මෙතෙක් ඉඩම් හිමි වංශාධිපතිවරුන්ට හිමිව තිබූ බලතල හා අයිතිවාසිකම් ඔවුන්ගෙන් ගිලිහෙන්නට විය. ජාතික රාජ්‍යවල රජවරු තමන්ගේ පාලන කටයුතුවල දී අලුතින් බිහි වූ මෙම මධ්‍යම පන්තිකයන් සහාය කර ගත්හ. ඔවුන්ගේ වෙළෙඳ කටයුතු සඳහා රාජ්‍ය අනුග්‍රහය ද ලැබුණි.

## ආර්ථික නවෝදය

පුනරුද සමයේ යුරෝපයේ ආර්ථික කටයුතු වල පුළුල් වෙනසක් සිදු විය. මධ්‍යතන යුගයේ ප්‍රවේණිය කේන්ද්‍ර කොට පැවති ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමය පරිහානියට පත් වී වෙළෙඳාමේ දියුණුවක් මෙකල ඇති විය. යුරෝපයේ ජාතික රාජ්‍යයන් බිහි වීමෙන් පසු වෙළෙඳ කටයුතු පුළුල් කිරීම සඳහා රජයේ අනුග්‍රහය සෘජුවම ලැබුණි. ඒ සඳහා යුරෝපා රටවල ජාතික වෙළෙඳ ප්‍රතිපත්ති, ජාතික බදු ප්‍රතිපත්ති ක්‍රියාත්මක විය. එමෙන්ම දේශ ගවේෂණයෙහි ප්‍රතිඵලයක් වශයෙන් නව මුහුදු මාර්ග සොයා ගැනීමෙන් යුරෝපා ජාතීන්ට පෙරදිගට හා ඇමරිකා මහාද්වීපයට පැමිණීමට හැකි විය. මේ නිසා එම ප්‍රදේශවල තිබූ වෙළෙඳ ද්‍රව්‍ය එනම් කුළු බඩු, රන් රිදී, මුතු මැණික්, ඇතුන්, ඇත් දළ වැනි දේ යුරෝපයට ගෙන යාමට හැකියාව ලැබුණි. මේ ඔස්සේ වෙළෙඳාමේ දියුණුවක් ඇති විය.

වෙළෙඳ කටයුතු පුළුල් වීමත් සමඟ මුදල් භාවිතය වැඩි විය. මුදල් නෝට්ටු හා කාසි භාවිතය ප්‍රචලිත විය. ගනුදෙනු සඳහා මුදල් දුර බැහැර ගෙන යාම දුෂ්කර හා අනාරක්ෂිත වූ නිසා චෙක්පත් හා බැංකු අණකර ක්‍රමය පුනරුද සමයේ ආරම්භ විය. ව්‍යාපාරිකයන්ට තම වෙළෙඳ කටයුතුවලට අවශ්‍ය මුදල් ණයට දීම ද බැංකු මඟින් සිදු කෙරිණි.

## නව වෙළෙඳ මාර්ග සොයා ගැනීම

ක්‍රි.ව 1453 දී කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කිවරුන් යටත් කර ගැනීමත් සමඟ යුරෝපීන්ගේ පෙර අපර දෙදිග වෙළෙඳ කටයුතුවලට බාධා ඇති විය. මුහුදු හා ගොඩබිම වෙළඳ මාර්ග සියල්ලම

පාහේ තුර්කි අධිරාජ්‍ය යටතට පත් විය.

ඒ නිසා ආසියාතික භාණ්ඩ ලබා ගැනීම සඳහා පෙර දිගට ළඟා විය. හැකි නව මුහුදු මාර්ග සෙවීමට යුරෝපියයෝ පෙලඹුණහ.

නව මුහුදු මාර්ග සොයා යාමේ ගමන සාර්ථක කර ගැනීමට සුදුසු පරිසරයක් ද යුරෝපයේ මේ වන විට සකස් වෙමින් තිබුණි. එනම්,

- නාවික ගමන්වල සුරක්ෂිතව යෙදීමට හැකි මාලිමා යන්ත්‍රය, උතුරු තරු මාපකය නිපදවීම
- පුනරුදයේ දී ලෝකය ගෝලාකාර බව සොයා ගැනීම
- ටොලමිගේ ලෝක සිතියම මගින් ලෝකය පිළිබඳ නිසි අවබෝධයක් ලැබීම
- ජාතික රාජ්‍යයන් මෙම ගමන් සඳහා අනුග්‍රහ දැක්වීම

දේශ ගවේෂණය සඳහා මුලින් ම උනන්දු වූයේ සාගර බඳ රටවල් දෙකක් වූ පෘතුගාලය හා ස්පාඤ්ඤය යි. පෘතුගාලයේ හෙන්රි කුමාරයා (නාවික හෙන්රි) දේශ ගවේෂණ කටයුතුවලට විශාල අනුග්‍රහයක් ලබා දුන්නේය.

පෘතුගාලයේ සිට පෙරදිගට ළඟා වීම සඳහා මුහුදු මාර්ගයක් සෙවීමේ යෙදුණු බර්තෝලමියුඩයස් අප්‍රිකාවේ දකුණු තුඩුවට පැමිණ එහි දී කුණාටුවකට හසු වීම නිසා එයට කුණාටු තුඩුව නමින් නම් තබා ආපසු සිය රට බලා යාත්‍රා කළේය. පසුව පෘතුගාලයේ රජු විසින් එය සුභ පැතීමේ තුඩුව ලෙස නම් කරන ලදී.

බර්තෝලමියුඩයස් ගිය ගමන් මග ඔස්සේ ගමන් කළ වස්කෝද ගාමා ඉන්දියාවේ කැලිකට් වරායට ළඟා විය. මෙය යුරෝපියයන් ප්‍රථමයෙන් ආසියාවට පැමිණීමට සොයා ගත් නව මුහුදු මාර්ගය යි.

ස්පාඤ්ඤයේ පර්ඩිනන්ඩ් හා ඉසබෙලා රැජිනගේ අනුග්‍රහය යටතේ ක්‍රිස්ටෝපර් කොලම්බස්ට බටහිර ඉන්දියා දූපත් සොයා ගැනීමට හැකි විය. ඇමරිගෝ වෙස් පූෂි ඇමරිකාව (නව ලෝකය) සොයා ගත්තේය. පර්ඩිනන්ඩ් මැගලන් පිලිපීනය ද කැබේ සහෝදරයෝ කැනඩාව ද සොයා ගත්හ.

## පුනරුදයේ ගෝලීය ප්‍රවණතාව

පුනරුදය මුලින් ම ආරම්භ වූයේ ඉතාලියේ ප්ලෝරන්ස් නගරයෙනි. අනතුරුව එය ඉතාලියේ සෙසු ප්‍රදේශවලට ව්‍යාප්ත වී පසුව යුරෝපය පුරා පැතිරුණි. පුනරුද සමයේ ඇති වූ දේශ ගවේෂණ නිසා යුරෝපීයෝ නව රටවල් සොයා යාමට පටන් ගත්හ. එහි ප්‍රතිඵල වශයෙන් ආසියා, අප්‍රිකා හා ඇමරිකා මහද්වීපවල යුරෝපා බල ව්‍යාප්තියක් ඇති විය. 16 වන සියවසේ සිට ශතවර්ෂ හතරහමාරක් පමණ මෙකී මහද්වීප වල ඇතැම් රටවල් යුරෝපයේ විවිධ ජාතීන්ට අයත් යටත් විජිත බවට පත්ව තිබුණි. මේ නිසා දේශපාලන වශයෙන් මෙන්ම වෙළෙඳාම හා සමාජීය සංස්කෘතික වශයෙන් ද යුරෝපය හා සෙසු ලෝකය අතර සබඳතා ගොඩනැගුණි. මෙම සබඳතා නිසා මුද්‍රණ කර්මාන්තය ලොව පුරා පැතිරුණි. මෙමගින් යුරෝපයේ චින්තනය හා සාහිත්‍ය සෙසු රටවලත් ව්‍යාප්ත විය. යටත් විජිත වල ධනවතුන්ගේ දූ දරුවන් අධ්‍යාපන කටයුතු සඳහා යුරෝපයට යාමත් මේ සඳහා හේතු විය. යුරෝපීයයෝ තම යටත් විජිතවල තම තමන් ඇදහූ ආගම ප්‍රචාරය කළහ. එසේම දේවස්ථාන හා ගොඩනැගිලි ඉදිකිරීම මඟින් යුරෝපයේ එවකට ප්‍රචලිත වූ වාස්තු විද්‍යාව, කලා ශිල්ප සෙසු රටවලටත් ලැබුණි. යුරෝපය හා ලෝකයේ රටවල් අතර ඇතිවූ සබඳතා නිසා යුරෝපීය තාක්ෂණය හා විද්‍යාත්මක දැනුම ආදියත් ලොව පුරා පැතිරිණි. මෙමගින් පුනරුදය ගෝලීය ප්‍රවණතාවක් බවට පත් විය.

## 9.2 පුනරුදය ලංකාව කෙරෙහි බලපෑම

යුරෝපයේ ඇති වූ පුනරුදයේ බලපෑම මෙරටට ලැබුණේ දිවයිනට පැමිණි පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි ජාතිකයින් මඟිනි. මෙම ජාතීන් ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල බලය දැරූ කාලයෙහි උඩරට වෙනම ස්වාධීන රාජ්‍යයක් පැවති හෙයින් මෙරට සමාජයේ පුළුල් වෙනසක් ඇති කිරීමට ඔවුන්ට හැකියාව නොලැබුණි. එහෙත් වර්ෂ 1815 දී උඩරට රාජධානිය බ්‍රිතාන්‍යයන්ට යටත් වීමෙන් පසුව වර්ෂ 1948 දක්වා ලංකාව බ්‍රිතාන්‍ය යටත් විජිතයක් වශයෙන් පැවති හෙයින් එම කාලය තුළ මෙරට දේශපාලන ක්ෂේත්‍රයෙහි පමණක් නොව ආර්ථික හා සමාජ සංස්කෘතික වශයෙන් ද පුළුල් වෙනස්කම් රැසක් සිදු විය.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## දේශපාලන වෙනස්කම්

19 වන සියවස වන විට පුනරුදය, ආගමික ප්‍රතිසංස්කරණ, මුද්‍රණ ශිල්පයේ දියුණුව, ධනවාදයේ නැගීම හා කාර්මික විප්ලවය ආදිය හේතු කොටගෙන යුරෝපය තුළ පුළුල් චින්තන වෙනසක් ඇතිව තිබුණි. මේ අනුව බ්‍රිතාන්‍ය පාලන සමය තුළ මෙරට සිදු වූ වෙනස්කම් එම නව චින්තනයේ බලපෑම නිසා සිදු වූ බව සැලකිය හැකි ය. උඩරට රාජධානිය යටත් වන තෙක් සාම්ප්‍රදායික රාජාණ්ඩු ආණ්ඩු ක්‍රමයක් මෙරට පැවතියත් ලංකාව යටත් විජිතයක් බවට පත් වීමෙන් පසු එම පාලන ක්‍රමය අවසන් විය. ඉංග්‍රීසීන් විසින් හඳුන්වා දෙන ලද ආණ්ඩු ප්‍රතිසංස්කරණ නිසා පසුකාලීනව පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් මෙරටට ලැබුණි. බ්‍රිතාන්‍ය පාලන කාලය තුළ එතෙක් මෙරට පැවති ප්‍රදේශීය පාලන ක්‍රමය ද වෙනසකට ලක් විය. උඩරට රාජධානි සමයේ සිටි අධිකාරම්වරු, දිසාවෙවරු, මොහොට්ටාලවරු, හා කෝරාළවරු වැනි සම්ප්‍රදායික නිලධාරීන් පන්තිය වෙනුවට අලුත් පාලන ක්‍රමයට ගැළපෙන නව නිලධාරීන් පන්තියක් මෙන්ම පරිපාලන ආයතන පද්ධතියක් ද බිහි විය. එසේම මෙරට පැවති පැරණි නීති රීති පද්ධතිය ද අභාවයට ගියේ ය. ලන්දේසීන්ගේ පාලන කාලයේ රෝම ලන්දේසි නීතිය මෙරටට හඳුන්වා දී තිබුණි. බ්‍රිතාන්‍ය පාලන කාලයේ දී සමකාලීන යුරෝපීය නීති මූලධර්මවලට අනුකූල නීති රීති පද්ධතියක් ද යුක්තිය පසිඳලීමේ අධිකරණ පද්ධතියක් ද මෙරට ස්ථාපිත විය.

## ආර්ථික වෙනස්කම්

මධ්‍යතන යුගයේ දී යුරෝපා වෙළෙඳ කටයුතුවල දී කැපී පෙනුණ වැනීසිය, ජිනෝවා, කොන්ස්තන්තිනෝපල් වැනි මධ්‍යධරණී මුහුද ආශ්‍රිත නගර වෙනුවට පුනරුද සමයෙන් පසුව පෘතුගාලය, ස්පාඤ්ඤය, ප්‍රංශය, ඕලන්දය හා එංගලන්තය වැනි අත්ලාන්තික් සාගරය ආශ්‍රිත රටවලට වැදගත් තැනක් ලැබුණි.

යුරෝපීයන් මෙරටට පැමිණීමත් සමඟ ලංකාව හා යුරෝපය අතර සෘජු වෙළෙඳ සබඳතා ආරම්භ විය. වෙළෙඳාම ඉලක්ක කර ගනිමින් ලන්දේසීන් මෙරට කුරුඳු වගා කළ අතර බ්‍රිතාන්‍යයෝ කෝපි, කොකෝවා, සිංකෝනා, තේ හා රබර් වැනි වෙළෙඳ බෝග වගා කළහ. යුරෝපීයන් යටතේ මෙරට වාණිජ ආර්ථික රටාවකට හුරුවීම නිසා එතෙක් පැවති ග්‍රාමීය ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය බිඳ වැටුණි. ඉංග්‍රීසීන් විසින් ක්‍රියාත්මක කළ ආර්ථික ප්‍රතිසංස්කරණ නිසා ලංකාවේ ආනයන අපනයන ආර්ථිකයක් බිහි විය. මේ නිසා ආහාර ද්‍රව්‍ය පවා ලංකාවට ආනයනය කෙරිණි. මීට අමතරව මුදල් භාවිතය ප්‍රචලිත වීම, දුම්රිය මාර්ග හා මහා මාර්ග පද්ධතියක් ඇති වීම. කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය වැනි වෙළෙඳ නගර බිහි වීම සහ නව ධනෝපායන මාර්ගවලින් මුදල් උපයා ගත් මධ්‍යම පන්තියක් බිහි වීම ආර්ථික වශයෙන් මෙරට සිදු වූ තවත් වෙනස්කම්වලට උදාහරණ වේ.

## සමාජ සංස්කෘතික වෙනස්කම්

මුද්‍රණ කර්මාන්තය ලංකාවට හඳුන්වා දීම පුනරුදයේ බලපෑම මෙරටට ලැබුණු තවත් අවස්ථාවකි. මුද්‍රණ කර්මාන්තය මෙරටට හඳුන්වා දෙන ලද්දේ ලන්දේසීන් විසින් වුවත් එය වඩාත් ප්‍රචලිත වූයේ බ්‍රිතාන්‍ය පාලන සමයේ දී ය. මුද්‍රණ කර්මාන්තයේ දියුණුවත් සමඟ පොත් පත්, සඟරා හා පුවත්පත් ආදිය ප්‍රකාශයට පත් වීම නිසා සමාජයේ දැනුවත් භාවය ඉහළ ගියේය. එමගින් යුරෝපා චින්තනයත් සාහිත්‍යයත් මෙරටට ලැබුණි. බ්‍රිතාන්‍ය පාලන සමයේ දී ඇතැම් ලාංකිකයන් යුරෝපා රටවලට ගොස් අධ්‍යාපනය ලබා මෙරටට පැමිණීමත් බටහිර චින්තනය මෙරටට ලැබුණු මාර්ගයකි.

ලංකාවට යුරෝපීයන් පැමිණියේ යුරෝපයේ ක්‍රිස්තියානියේ එක්සත්කම බිඳ වැටුණු අවධියක දී ය. වර්ෂ 1517 දී යුරෝපයේ සිදු වූ ආගමික විප්ලවය එයට හේතු විය. පෘතුගීසි ජාතිකයෝ මෙරට මුහුදුබඩ ප්‍රදේශවල රෝමානු කතෝලික ආගම ව්‍යාප්ත කළ අතර ලන්දේසීහු තමන් ඇදහූ රෙපරමාදු භක්තිය මෙරට ප්‍රචලිත කළහ. මෙමඟින් යුරෝපයේ පැවති ආගමික නිකායන් මෙරට පැතිරුණි. ලන්දේසි පාලන කාලයේ දී මෙන්ම බ්‍රිතාන්‍ය පාලන සමයේ දී මෙරට ක්‍රියාත්මක කළ අධ්‍යාපන කටයුතු නිසා බටහිර අධ්‍යාපන ක්‍රමය මෙරට ප්‍රචලිත විය. එසේම යුරෝපීයන් ලංකාව තුළ ඉදිකළ දේවස්ථාන හා වෙනත් ගොඩනැගිලි ආදියෙන් යුරෝපයේ පැවති වාස්තු විද්‍යාව මෙරටට ලැබුණි.

**ක්‍රියාකාරකම**

යුරෝපයේ ඇති වූ පුනරුදය ශ්‍රී ලංකාවේ දේශපාලනික, ආර්ථික, සංස්කෘතික අංශ කෙරෙහි බලපෑ ආකාරය පැහැදිලි කරන්න.

**වැදගත් කරුණු**

1. යුරොපයේ 14 වන හා 16 වන සියවස් අතර කාලය තුළ කලාත්මක හා විද්‍යාත්මක අංශවල සිදු වූ පුළුල් පරිවර්තනය පුනරුදය ලෙස හැඳින්විය හැකිය.

2. යුරෝපයේ පුනරුදය ආරම්භ වීමට තුඩු දුන් හේතු රැසක් පවතී.

3. පුනරුදය මුලින් ම ආරම්භ වූයේ ඉතාලියේ ප්ලොරන්ස් නගරයෙනි.

4. පුනරුද සමයේ කලාත්මක හා විද්‍යාත්මක ක්ෂේත්‍රවල ඇති වූ පරිවර්තනය නිසා මිනිස් චින්තනයේ වෙනසක් ඇති විය.

5. පුනරුද සමයේ නව වෙළෙඳ මාර්ග සොයා යාම නිසා යුරෝපය හා සෙසු ලෝකය අතර නව සබඳතා ගොඩනැගුණි.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.